ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டுத் தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

**මෙහෙයුම් උපදෙස් අංක : 35/01/005/0007/14**

2019 පෙබරවාරි 22

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,**

**සංචිත අවශ්‍යතා**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනත (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වන අධිකාරිය) සංශෝධිත පරිදි 10(ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ 2019 පෙබරවාරි 22 වැනි දින අංක 2111/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද (ඇ) නිවේදනය සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. ඉහත සඳහන් නිවේදනය ප්‍රකාර සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් පවත්වා ගෙන යනු ලබන මුළු තැන්පතු වගකීම්වලින් සියයට පහක (5.00%) ප්‍රමාණයක් සංචිතයක් ලෙස පවත්වාගෙන යා යුතුය.

3. 2018 නොවැම්බර් 14 වැනි දින මෙහෙයුම් උපදෙස් අංක 35/01/005/0007/13 හි (අ) උපලේඛනය, මෙහි අමුණා ඇති (අ) උපලේඛනය ලෙස ප්‍රතිෂ්ඨාපනය වේ.

4. ඉහත සඳහන් සංශෝධනය 2019 මාර්තු 01 සිට බලපැවැත්වෙනු ඇත. 2013 අප්‍රේල් 22 වැනි දින අංක 35/01/005/0007/06 සහ 35/01/005/0007/07 දරන මෙහෙයුම් උපදෙස්වල අඩංගු අනෙකුත් උපදේශන තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව
தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை
Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka
+94 112 477036 | +94 112 346287 | ddod@cbsl.lk | www.cbsl.gov.lk

## 'අ' උපලේඛනය

### වාර්තා කිරීමේ ආකෘතිය

### දෛනික තැන්පතු වගකීම් සාමාන්‍ය පිළිබඳ වාර්තාව

බැංකුවේ නම : ........................................................................................

කාල වකවානුව : ............................................................... සිට .................................................................... දක්වා
(දිනය) (දිනය)

වෙත : අධ්‍යක්ෂ,
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

ඉහත දක්වා ඇති කාල පරාසයේ එක් එක් දිනයට අදාළ දෛනික ව්‍යාපාර කටයුතු අවසානයේ දී, බැංකුවේ පොත්වල සඳහන් තැන්පතු ශේෂය පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට තැන්පතු වගකීම් හි සාමාන්‍යය වාර්තා කළ යුතුය.

| (i) | (ii) | (iii) | (iv) |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | කාලීන හා ඉතුරුම් තැන්පතු | ණයවර ලිපි/ප්‍රතිග්‍රහණය මත ලියවිලි සඳහා ආන්තික අවශ්‍යතාව | අනෙකුත් සියළුම තැන්පතු වගකීම්[1] |
| | | | |

1.තැන්පතු සහතික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල විය යුත්තේ ප්‍රකාශ කළ වටිනාකමයි.

## සංචිත අවශ්‍යතා

අදාල සංචිත කාල පරිච්ඡේදය: ..................................................................................................

| අයිතමය | අගය ශ්‍රී ලංකා රුපියල්වලින් |
|---|---|
| 1. ණයවර ලිපි සඳහා වන සියයට 100 ක සාමාන්‍ය දෛනික සමස්ත ආන්තික අවශ්‍යතාව පහත දක්වා ඇති ණයවර ලිපි සඳහා අවස්ථානෝචිතව සුදුසු පරිදි:<br>(අ)(i) 2018 සැප්තැම්බර් මස 19 දින අංක 35/01/005/0010/20 දරන "මෝටර් රථ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව හෝ<br>(ii) 2018 සැප්තැම්බර් මස 29 දින අංක 35/01/005/0010/21 දරන "මෝටර් රථ හා අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව.<br>(ආ) 2018 ඔක්තෝබර් මස 11 දින චක්‍රලේඛ අංක 2 දරන ප්‍රතිග්‍රහණය මත ලියකියවිලි ලබා දීමේ කොන්දේසිය අනුව සිදුකරන ආනයන සඳහා වන ආන්තික අවශ්‍යතාව. | |
| 2. ඉහත අංක 1 හැර දෛනික රුපියල් තැන්පතු වගකීම්වල මුළු එකතුවේ සාමාන්‍ය අගයෙන් සියයට 5.0 ක්. | |
| 3. ඉහත (1) සහ (2) මගින් ආවරණය වන තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් සියයට 2 ට වඩා වැඩියෙන් නමුත් සියයට 4 නොඉක්මවා තබාගෙන ඇති ශ්‍රී ලංකා රුපියල් කාසි හා නෝට්ටුවල සාමාන්‍යය. | |
| 4. සංචිත නඩත්තු කාලය තුළ පවත්වා ගෙන යා යුතු මුළු සංචිත අවශ්‍යතාවය (1 + 2 - 3) | |

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි සහ මෙම බැංකුවේ පොත්වලට අනුකූල බව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති නියෝගවලට අනුකූල බවද අපි / මම සහතික කරමු / කරමි.

........................ ........................................................................

දිනය නිල මුද්‍රාව

සටහන -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැර වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන තැන්පතු සහ ස්ථාන ගත කිරීම්, නියම කර ඇති අනුපාත වලට අනුව සංචිත අනුපාත පවත්වා ගෙන යාම සඳහා ගිණුම් ගත කළ යුතුය.

(ආ) සියලු අගයන් ආසන්න රුපියලට දැක්විය යුතුය.